# පොලිස් නිශ්කාශන වාර්තා අයදුම් කිරීම.

- ඊශ්‍රායල් PIBA ආයතනයේ ලොතරැයි දිනුම් ඇදීම මගින් තෝරා ගන්නා ඔබ විසින් පොලිස් වාර්තාව අයදුම් කළ යුතු අතර, එය අයදුම් කිරීම www.police.lk හරහා online මාර්ගයෙන් සිදු කළ යුතුය. මේ සඳහා අවශ්‍ය උපදෙස් කාර්යාංශ වෙබ් අඩවියේ පල කර ඇත.
- නමුත් ඔබ විසින් පොලිස් නිෂ්කාශන වාර්තාව අයදුම් කිරීමේදී උපන් දිනයේ සිට අයදුම් කරනු ලබන දින දක්වා පදිංචිය වෙනස් කිරීම් සහ එක් දිනක් හෝ ඕනෑම රටක් වෙත විදේශගත වී ඇත්නම්, ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ඔබගේ ගමන් බලපත්‍රයේ සටහන් කරන ලද පිටත්වීමේ හා පැමිණීමේ මුද්‍රාවල සඳහන් අයුරින්ම එම දින සියල්ලම අනුපිළිවෙලින් ඇතුලත් කළ යුතුය.
- පොලිස් වාර්තා ඉල්ලුම් කිරීමේ දී ලබන්නාගේ (ඔබගේ) පෞද්ගලික ලිපිනය සඳහන් කල යුතු අතර එය පෞද්ගලිකව බාරගෙන දැනුම් දෙන දිනකදී කාර්යාංශය වෙත බාර දිය යුතුය.
- පොලිස් වාර්තාව ඉල්ලුම් කිරීමේදී **"H. E. THE AMBASSADOR, EMBASSY OF THE ISRAEL, NEW DELHI, INDIA"** යන ලිපිනය සඳහන් කල යුතුය.
- ගමන් බලපත්‍රයෙහි පිටත්වීම හා පැමිණීම සම්බන්ධව ආගමන විගමන මුද්‍රා අපැහැදිලි අවස්ථාවන්හිදී ආගමන විගමන කාර්යාලය වෙත ගොස්, එම දිනයන්හි නිවැරදි බව තහවුරු කර ආගමන විගමන කාර්යාලයෙන් අදාල වාර්තා ලබා ගෙන ඉදිරිපත් කල යුතුවේ.